# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළිබෝධ නාශක පාලනය කිරීමේ
## (සංශෝධන)

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් 2011 අප්‍රේල් මස 27 වන දින ඉදිරිපත් කරන ලදී.

Act No:- ~~2011~~ 31 of 2011

(ගැසට් පත්‍රයේ පළ කළේ 2010 නොවැම්බර් මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[104 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.00 යි　　　　තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

මේ පනත් කෙටුම්පත මගින්, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 24 වන වගන්තිය, වරද සම්බන්ධයෙන් ගෙවිය යුතු දඩ මුදල වැඩි කිරීම මගින්, සංශෝධනය කිරීමට උත්සාහ කරනු ලැබේ.

## පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 26/2008.

### 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක ..... දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. 1994 අංක 6 දරන පනතින් සංශෝධිත, 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 24 වන වගන්තිය තවදුරටත්, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *1980 අංක 33 දරන පනතේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය :" යන වචන වෙනුවට "ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු අතර, රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය:" යන වචන ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

2—PL 006611—1,000 (2011/04)